අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව ගෙනු இல. My Ref. ED/09/12/02/01/02

ඔබේ යොමුව உமது இல. Your Ref.

දිනය திகதி Date 2026.10.20

The Founder Chairman
Brainstormer Foundation
220 Horape Ragama

Request for Approval to Organize the Geometric Abstract Arts Competition as a School Event

උක්ත කරුණ සම්බන්ධව ඔබ විසින් යොමු කරන ලද 2026.09.25 දිනැති ලිපිය සම්බන්ධවයි.

02. එමඟින්, STEAM Education සංකල්පය ප්‍රවලිත කිරීම අරමුණු කර ගනිමින් " **Geometric Abstract Arts** " තරඟය පාසල් දැනුවත් කිරීමට හා පාසල් සිසුන් සහභාගි කර ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

03. ඒ අනුව, අධ්‍යාපන අධ්‍යක්ෂ (ගණිත) නිර්දේශවලට අනුකූලව පහත සඳහන් කොන්දේසිවලට යටත්ව උක්ත වැඩසටහන සඳහා සිසුන් සහභාගි කර ගැනීමට අනුමැතිය ලබා දෙන බව කාරුණිකව දන්වමි.

1. පාසල්වල විදුහල්පති දැනුවත් කර එකඟතාව ලබා ගත යුතු ය.
2. පළාත් පාසල් සම්බන්ධ කරගන්නේ නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අවසරය ලබාගත යුතු ය.
3. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධා නොවන පරිදි පාසල් පැවැත්වෙන වේලාවෙන් පසුව හෝ පාසල් නිවාඩු දිනවල මෙම වැඩසටහන සඳහා සිසුන් සහභාගි කර ගත යුතුය.
4. සහභාගිවීම සඳහා සිසුන්ට බලපෑම් නොකළ යුතුය.
5. ගුරුවරුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ වැඩසටහනට සිසුන් සම්බන්ධ කරගත යුතුය.
6. සිසුන්ගෙන් හෝ දෙමාපියන්ගෙන් කිසිදු මුදලක් හෝ ප්‍රතිලාභයක් හෝ ලබා නොගත යුතු ය.
7. ඉදිරිපත් කරනු ලබන සියලුම නිර්මාණවල සිසු අනන්‍යතාව තහවුරු කළ යුතු ය.
8. දෙමාපිය ලිඛිත අවසරය ලබා ගත යුතු ය.
9. සිසුන්ගේ පෞද්ගලික තොරතුරු ලබා ගනිමින් වැඩසටහනෙන් පසු ඔවුන් හා සම්බන්ධ නොවිය යුතු ය.
10. මෙම වැඩසටහන සඳහා සහභාගි වන සිසුන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය, විනය හා පහසුකම් සම්බන්ධ සියලු ම වගකීම ඔබ ආයතනය මඟින් දැරිය යුතුය.
11. සහභාගි වන සිසුන්ගේ චරිතයට, අභිමානයට හා ගෞරවයට හානි නොවන ආකාරයට කටයුතු සිදු කළ යුතුය.
12. මේ සඳහා සහභාගි වන නිලධාරීන්, දේශකයින්, සම්පත්දායකයින් විනය විරෝධී විෂමාචාර ක්‍රියාවන්ට සම්බන්ධ නොමැති හා සුදුසුකම් සහිත පුද්ගලයින් විය යුතුය.
13. මෙම වැඩසටහන තුළින් ආයතනය සඳහා සෘජුව හෝ වක්‍රව අරමුදල් රැස්කිරීමක් සිදු නොකල යුතුය.
14. පවත්වන තරඟවල විනිශ්චය සම්බන්ධව විනිවිදභාවය සහ අපක්ෂපාතීබව පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

ගරු අමාත්‍යතුමිය கௌரவ அமைச்சர் Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් செயலாளர் Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

15. ළමා මනසට නොගැලපෙන ආකල්ප වර්ධනය වන ආකාරයේ කිසිදු කටයුත්තක සිසුන් නොයෙදවිය යුතුය

තවද, මෙහි දී අවස්ථානුකූලව පැන නඟින ඕනෑම සුවිශේෂී ගැටලුවක දී හදිසි කෙටි දැනුම්දීමකින් වැඩසටහන සඳහා ලබා දෙන ලද අවසරය අවලංගු කිරීමේ බලය මෙම අමාත්‍යාංශයේ ලේකම් සතු වන බව ද වැඩිදුරටත් දන්වමි.

එන්.ජී.එස්.සිරිවර්ධන
අධ්‍යාපන අධ්‍යක්ෂ(වැ.ඛ)
(පාසල් කටයුතු)

අත්. කළේ/ පී. ආර්. කාරියවසම්
අතිරේක ලේකම් (පාසල් කටයුතු)
ලේකම් වෙනුවට

පිටපත් :

1. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,..... පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
2. අධ්‍යාපන අධ්‍යක්ෂ, ජාතික පාසල්
3. අධ්‍යාපන අධ්‍යක්ෂ, ගණිත

} කරු.දැ.ගැ.ස.